# ශිෂා (shisha) දුම්කොළ සංශෝධන

## ව්‍යාපාර වෙත කරුණු පත්‍රිකාවක්

ව්‍යාපාර සඳහා වන මෙම කරුණු පත්‍රිකාව ශිෂා දුම්කොළ අලෙවිය, ප්‍රචාරණය සහ පාවිච්චිය හා සම්බන්ධ වික්ටෝරියානු දුම්කොළ පාලන නීති වල සාරාංශයකි.

## සංශෝධන

1987 දුම්කොළ පනත (*Tobacco Act 1987)* (දුම්කොළ පනත) යටතේ **2017 අගෝස්තු** 1 වන දින සිට **ඕනෑම ප්‍රමාණයක්** දුම්කොළ අඩංගු ශිෂා දුම්කොළ අලෙවිය, ප්‍රචාරණය සහ පාවිච්චිය, සිගරට් සහ සුරුට්ටු වැනි අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත හා සමාන ලෙස සළකණු ලැබේ .

මේ වෙනස්වීම් අනුව ශිෂා දුම්කොළ:

- දුම් පානය තහනම් ස්ථාන වල පාවිච්චි කිරීම තහනම් වේ
- වයස අවුරුදු 18 ට අඩු අයෙකුට විකිණීම තහනම් වේ
- අලෙවි කරන ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රචාරණය කිරීම තහනම් වේ
- වාහනයක් වැනි තාවකාලික ස්ථානයකින් විකිනීම තහනම් වේ
- ශිෂා හෝ උක්පැණි මණ්ඩි දුම්කොළ නිෂ්පාදිත අලෙවිය ප්‍රවර්ධනය කිරීම පිණිස දීම හෝ නොමිලයේ දීමට පිළිගැන්වීම තහනම් වේ.

මේ වෙනස්වීම් මධ්‍යම ආණ්ඩුවේ දුම්කොළ සරල ඇසුරුම් නීති සමගද පෙළ ගැසේ. එම නීති අනුව ශිෂා දුම්කොළ නිෂ්පාදිත, චිත්‍රක සෞඛ්‍ය අවවාද රූප සහිත අනිවාර්ය සරල ඇසුරුම් වල ඇසිරිය යුතු වේ.

දුම්කොළ අඩංගු නැති, පලතුරු හෝ ශාකමය නිෂ්පාදිත වලට මේ නීති ආදාල නොවේ.

## නීතියට අනුකුල වීම

### ශිෂා දුම්කොළ පානය තහනම් ස්ථාන

දුම්කොළ පනත යටතේ දුම් පානය තහනම් සෑම ස්ථානයකම ශිෂා දුම්කොළ පානය තහනම්ය. කැෆේ අවන්හල්, විවේකාගාර සහ බලපත්‍ර සහිත පරිශ්‍ර වැනි ආවෘත සේවාස්ථාන මීට ඇතුළත් වේ.

2017 අගෝස්තු 1 වන දින සිට දුම් පානය තහනම පහත ස්ථාන වලටද බලපානු ලැබේ:

- එළිමහන් ආහාර අනුභව කරන ස්ථාන
- එළිමහන් ආහාර අනුභව කරන ස්ථාන වලට මීටර් 4ක් ඇතුලත එහි යම් කොටසක් හෝ අයත් වෙන පානය කරන ස්ථාන (අවම වශයෙන් මීටර් 2.1 ක උස තාප්පයකින් එම ස්ථානය වෙන් කර නැත්නම්)

අලුත් නීතියට අනුකුල වීම පිණිස ශිෂා කැෆේ සහ විවේකාගාර වැනි ව්‍යාපාර තම ක්‍රියාන්විත සහ මෙහෙයුම් වල වෙනස්කම් ඇතිකළ යුතුය.

මෙම නීති නිමවා ඇත්තේ ප්‍රජා සෞඛ්‍යය සහ සුබසාධනය වැඩිදියුණු කිරීමට සහ ආරක්ෂා කිරීමටය. සේවාස්ථාන වල සේවකයන් සහ පාරිභෝගිකයන් ආරක්ෂා කරන දුම් බීමේ නීති මෙමගින් දීර්ග කෙරේ.

දුම් පානය තහනම් නැති, තම ස්ථානයට බැඳුණ එළිමහන් අවකාශයන් මේ සඳහා සළකා බැලීමට මේ නීතිය බලපාන ව්‍යාපාර වලට පුළුවන. අඩිපාර අවකාශයන් ශිෂා දුම්කොළ පානය සඳහා පාවිච්චි කිරීමට අවසර ලබාගැනීම ගැන ව්‍යාපාර විසින් තම ප්‍රදේශයේ කවුන්සලය සමග කතා කළ යුතුය.

### ශිෂා දුම්කොළ අලෙවි කිරීම

කළමනාකරුවන් සහ සේවකයන් කෙනෙකුට ශිෂා දුම්කොල විකිණීමට පෙර එම පුද්ගලයා අවුරුදු 18ට වැඩි කෙනෙක් බව සහතික කරගත යුතුය. බොහෝ විට පිළිගත හැකි හැඳුනුමක් ඉල්ලීම අවශ්‍ය වනු ඇත.

සේවකයන් විසින් නීතියට අනුකුලව ශිෂා දුම්කොළ අලෙවි කරණු ලැබීමේ වගකීම කළමනාකරුවන් සතුය. සේවකයන්ව සෑම මාස හයකට වරක් පුහුණු කර, ඔවුන් පුහුණුව ලද බව ස්ථිර කරන ලිඛිත ප්‍රකාශනයක් සේවකයන්ගෙන් ලබාගැනීම මගින් කළමනාකරුවන්ට දඩ ලැබීම වළක්වා ගත හැකිය. පුහුණුවට මේ දේ ඇතුළත් විය යුතුය:

- සේවකයන් විසින් 18ට අඩු අයට ශිෂා දුම්කොළ අලෙවි නොකළ යුතුය
- 18ට අඩු වීමට ඉඩඇති කෙනෙකුට ශිෂා දුම්කොළ විකිනීමට පෙර සේවකයන් විසින් හැඳුනුම් ඉල්ලා පරීක්ෂාකර බැලිය යුතුය
- 18ට අඩු කෙනෙකුට සේවකයන් විසින් ශිෂා දුම්කොළ විකිනුවහොත් ඔවුන් දඩයක් ලැබිය හැකි වරදක් කර ඇත.

#### ශිෂා ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රචාරණය කිරීම

විකිනීමට ඇති ශිෂා දුම්කොළ සහ ඊට සම්බන්ධ සියලු ප්‍රචාරණයන් සාප්පුවේ ඇතුලත හෝ පිටත කිසිම තැනක දෘෂ්‍යමාන නොවිය යුතුය.

අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත හා සමානව ශිෂා දුම්කොළ අල්මාරියක හෝ කවුන්ටරය පිටුපස තැබීමට හැකිය.

## වෙනස් කිරීම් වලට හේතු

2006 වසරේ සිට වික්ටෝරියාවේ ආවෘත සේවාස්ථාන ඇතුලත දුම් පානය තහනම් විය. දුම්කොළ **ප්‍රධාන** සංරචකය වන ශිෂා දුම්කොළ වලටද මෙම තහනම බලපායි.

මෑතදී කළ වෙනස්කම් මගින් දුම්කොළ ඕනෑම ප්‍රමාණයක් අඩංගු ශිෂා සඳහා, ශිෂා දුම්කොළ නීති දීර්ග කරයි. මෙසේ කරනුයේ ප්‍රජා සෞඛ්‍යය ආරක්ෂා කිරීමටත් දුම්කොළ ආශ්‍රිත අසනීප සහ රෝග අවම කිරීමත් පිණිසය.

අලුත් නීති වල අරමුණු:

VICTORIA State Government | Health and Human Services

- අන් කෙනෙකුගේ ශීෂා දුම්කොළ දුමට විවෘත (second-hand smoke) වීමෙන් ඇතිවන හානිකර ප්‍රතිඵල වලින් ශීෂා කැෆේ, විවේකාගාර වැනි ආවෘත සේවාස්ථාන වල සේවකයන් සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම
- වයස අවුරුදු 18 ට අඩු අය ශීෂා දුම්කොළ මිළදී ගැනීම සහ ලබා ගැනීම වැළැක්වීම
- මේ  ආකාරයේ දුම් පානයට ආකර්ෂණය විය හැකි ළමුන් සහ තරුනයින් ශීෂා දුම්කොළ පානය පටන් ගැනීම වැළැක්වීම
- දුම් පානය අතහැරීමට උත්සාහ කරන අයට හෝ ලඟදී දුම් පානය අත්හල අයට උදව් වීම
- අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත පාලනය කර ඇති ආකාර සමග සංගතභාවය ඇතිකිරීම .

### සෞඛ්‍ය අවදානම්

ශීෂා දුම්කොළ පානය සහ එම දුමට විවෘත වීමෙහි හානිකර සෞඛ්‍ය අවදානම් ඇති බවට ප්‍රබල සාක්ෂි ඇත. ශීෂා දුම්කොළ පාවිච්චි කරන්නන් සහ අන් අයගේ ශීෂා දුම්කොළ දුමට විවෘත වුවන්, පෙනහලු පිළිකා, ශ්වසන රෝග, ගර්භණී අවධියේ අඩු උපත් බර ඇතුලු, සිගරට් බීම හේතුවෙන් හටගන්නා නොයෙකුත් රෝග හටගැනීමේ අවදානමට ලක් වේ.

සිගරට් බීම වෙනුවට ශීෂා දුම්කොළ පානය නිරුපද්‍රූත විකල්පයක්ය යන පොදු වැරදි වැටහීමක් තිබේ. මෙය අසත්‍යය.  සිගරට් බීම හා සසඳන විට ශීෂා දුම්කොළ පානය කරන්නන් ඒ හා සමාන හෝ ඊට ඉහල මට්ටමක හානිකර රසායන ද්‍රව්‍ය වලට විවෘත වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, එක ශීෂා දුම් බීමේ වාරයකදී, සිගරට් 100ක් බීමෙන් ආඝ්‍රාණය කරන දුම් ප්‍රමාණයට සමාන දුම් ප්‍රමාණයක් ආඝ්‍රාණය කරණු ලැබේ.[1]

## දඩුවම්

මීට දඩුවම් සිගරට් සහ සුරුට්ටු වැනි අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත වලට ඇති දඩුවම් හා සමාන වේ.උදාහරණයක් ලෙස, ඔබේ ව්‍යාපාරයේ ආවෘත සේවාස්ථානයක් හෝ එළිමහන් ආහාර අනුභව ස්ථාන වැනි දුම් පානය කිරීම තහනම් ස්ථානයක ශීෂා දුම් පානය කිරීමට ඔබ ඉඩ දුන්නොත්, ඔබට 2017-18 දී  $317 කට සමාන,  දඩුවම් ඒකක දෙකක දඩයක් ලැබීමට හැකිය.[2]

## වැඩිදුර තොරතුරු

### වැඩිදුර තොරතුරු සඳහා:

- 1300 136 775 අංකය ඔස්සේ Tobacco Information Line  අමතන්න
- tobacco reforms website <www.health.vic.gov.au/tobaccoreforms>.වෙත පිවිසෙන්න

2001 අගෝස්තු 1 වන දින සිට ඇති නීතියේ නිශ්චිත පද යෝජනය බැලීමට වික්ටෝරියානු රජයේ  legislation website <www.legislation.vic.gov.au>  වෙබ් අඩවියට පිවිස *Tobacco Act 1987* පිරික්සන්න.

.

මෙම ප්‍රකාශනය වෙනත් ආකෘතියක ලබාගැනීමට 1300 136 775 අංකය ඔස්සේ Tobacco Information Line අමතන්න. අවශ්‍ය නම් 13 36 77 හරහා National Relay Service අමතන්න. නැතහොත් ඊමේල් මගින් tobaccopolicy@health.vic.gov.au අමතන්න.

වික්ටෝරියානු රජය මගින් අනුමත කර ප්‍රකාශ කරන ලදී.
Victorian Government, 1 Treasury Place, Melbourne.

© State of Victoria, May 2017.

**වියාචනය:** මෙම කරුණු පත්‍රිකාවේ අඩංගු උපදෙස් සාමාන්‍ය මගපෙන්වීම සඳහා පමණක් බව කරුණාවෙන් සළකන්න.  මෙම කරුණු පත්‍රිකාවේ අඩංගු උපදෙස් භාවිතය නිසා ඇතිවූ කිසිදු අලාභයක් හෝ හානියක් ගැන  Department  of Health and Human Services  වගකීමක් භාර නොගනී.  මෙම කරුණු පත්‍රිකාවේ අඩංගු කිසිවක් නිසි නීති උපදෙස් සඳහා ආදේශයක් නොවේ.

ISBN: 978-0-7311-7161-3

ලබා ගත හැකි අඩවිය
www.health.vic.gov.au/tobaccoreforms

---

[1] World Health Organization 2005, *Waterpipe tobacco smoking: health effects, research needs and recommended actions by regulators*, World Health Organization, Geneva

[2] දඩුවම් ඒකක වසරක් පාසා දර්ශකගත කෙරේ. 2017-18 දී එක දඩුවම් ඒකකයක්  $158.57ක.